# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,777 — 1961 නොවැම්බර් 20 වැනි සඳුදා — 20.11.1961**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

#### නිවේදනය

1946 හා 1947 ලංකා (ආණ්ඩු ක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 46(4) අංකිත ඡෙදයේ විධිවිධාන යටතේ, මෙම නිවේදනයේ අඩංගු දින සිට,

(ඒ) කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමාට මැතිවරණ (පාර්ලිමේන්තු හා ප්‍රාදේශීය සභා) දෙපාර්තමේන්තුව පැවරීම අවලංගු කර, ඒ අනුව, ඉහත සඳහන් ඡෙදය යටතේ අංක 12,165 හා 1960 ජුලි 23 වැනි දින දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පළකර පසුව වරින්වර සංශෝධනය කරන ලද නිවේදනයේ "Minister of Industries, Home and Cultural Affairs" යන ශීර්ෂය යටතේ පළමුවන තීරුවේ අඩංගු "Department of Elections, (Parliamentary and Local Bodies)" යන වචන හා එහි දෙවැනි තීරුවේ අඩංගු "Parliamentary Elections" යන වචන කපා හැරීමෙන් එකී නිවේදනය තවදුරටත් සංශෝධනය කරන ලද බවත්;

(බී) 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා නියෝගයේ 9,22 ඒ(1), 22 සී(1) ඒ හා 92 බී(3) ඡෙදයන් යටතේ වූ කාර්‍යයන් කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති තුමා වෙත පවරා ඇති බවත්;

මෙයින් දැනුම් දෙනු ලැබේ.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අගමැතිණිය.

අග්‍රාමාත්‍ය කාර්‍යාලය,
සෙනේට් ගොඩනැගිල්ල,
කොළඹ. 1961 නොවැම්බර් 13.

11–985


ලංකාවේ වැලව්වේතයෙහි පිහිටි "ඊස්ටන් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රාපිතයි.

2103—ජේ. ඇන්. ආර් 72—5,000 (11/61)